# නිදහස ලබා 63 වසර සැමරූ දා



ජනාධිපති රාජපක්ෂ මහතා පෙබ 4 දා කතරගම පූජා නගරයේ පැවති 63 වන ශ්‍රීලංකා නිදහස් දින උත්සවයේදි ජනතාව ඇමතූ අයුරුය මේ. පසුපසින් හමුදාපති ජගත් ජයසූරිය මහතාය.

Sri Lanka's President Mr Mahinda Rajapakse addresses the 63rd National Independence Day celebrations held on the 4th of February at Kataragama city in the South of Sri Lanka. The Sri Lanka Army Commander Jagath Jayasuriya is in the background.



ලන්ඩනයේ ශ්‍රීලංකා මහකොමසාරිස් කාර්යාලයද ශ්‍රීලංකා නිදහස් දිනය සැමරුවාය. එයට විශාල පිරිසක් සහභාගිවූ අතර බෞද්ධ, ක්‍රිස්තියානි, හින්දු සහ මුස්ලිම් ආගමික වතාවත් සිදු කෙරිණ. පින්තූරයේ දැක්වෙන්නේ ලන්ඩනයේ වැඩබලන ශ්‍රීලංකා මහ කොමසාරිස් වරයා වන පී. එම්. අම්සා මහතා පෙබරවාරි 4 වන දින උදයේ කාර්යාල සඳළුතලයේ ශ්‍රීලංකා ජාතික කොඩිය ඔසවමින් 63 වන නිදහස් සැමරුම ආරම්භ කළ ආකාරයයි.

The Sri Lanka High Commission in London celebrated the 63rd National Day on 04 February 2011 morning at the High Commission premises with the participation of Sri Lankans living in the UK representing Buddhist, Hindu, Christian and Muslim faiths. The picture shows, the hoisting of Sri Lankan National Flag by acting High Commissioner - Mr P. M. Amza on the balcony of the building.


Duke's Court Travel

DUKE'S COURT TRAVEL Travel Management

Fly to Colombo

SriLankan Airlines fr £350 + Taxes

Qatar Airways fr £320 + Taxes

Kuwait Airways fr £260 + Taxes

Emirates fr £430 + Taxes

Etihad Airways fr £334 + Taxes

Oman Air fr £199 + Taxes

Jet Airways fr £260 + Taxes

**Note:** All fares mentioned are low season / terms & conditions apply.

020 8748 3535

204 King Street, London W6 0RA


## සයිප්‍රස් හි ශ්‍රීලංකා නිදහස් දිනය සමරති



**ස**යිප්‍රස් හි ශ්‍රීලංකාරාම විහාරස්ථානයේ ප්‍රධානත්වයෙන් මෙවර 63 වන ශ්‍රී ලංකා ජාතික නිදහස් උළෙල නිකොසියා අගනගරයේ රුසියානු සංස්කෘතික මධ්‍යස්ථානයේදී 2011 පෙබරවාරි 6 වන ඉරුදින ඉතා උත්කර්ෂවත් අන්දමින් පැවැත් විණ. ශ්‍රීලංකාරාම විහාරාධිපති පූජ්‍ය මොරවක සෝරත නාහිමි, පූජ්‍ය සන්නස්ගම බුද්ධප්‍රිය හිමි, පැලැම්පිටියේ මහින්ද හිමි, කුඹුක්මුල්ලේ සිරිසුමන හිමි ආදී භික්ෂූන් වහන්සේලා ද ආරාධිත අමුත්තන් ලෙස කීසා ආයතනයේ සභාපති දොරෝස් පොලිකාපු මහතා, කොන්සල් කාර්යාලයේ සේවා භාර නිලධාරී ප්‍රනාන්දු මහතා සහ එම මහත්මිය මෙන්ම සයිප්‍රසයේ සිටින ශ්‍රීලාංකික විශාල පිරිසක් එදින සහභාගි වූහ.

කිව්පති සන්නස්ගම බුද්ධප්‍රිය ස්වාමීන් වහන්සේ විසින් බෞද්ධ ධජයද, ඉසුරු කොඩිතුවක්කු මහතා විසින් ජාතික ධජයද ඔසවනු ලැබීමෙන් පසු ලංකා භූමිය වෙනුවෙන් දිවිදුන් සියළු රණවිරුවන් සිහිකිරීම් වස් විනාඩි දෙකක නිහඬතාවක් පළකර උත්සවයේ කටයුතු ඇරඹිණ.

රැඟුම් ගැයුම් අනුසාරයෙන් සිංහළේ නිදහස්සටන ප්‍රේක්ෂක සිත් ජාතිකාලයෙන් ඔද වඩවමින් කරළිය මත පණගැන්විණ. සෝරත නාහිමියන්ගේ දේශාභිමානී කට හඬ ශාලාවේ සිටි අප කාගේත් නෙතට කඳුළක් නංවන්නට සමත්විය. මෙම උත්සවය මෙවන් රටක මින්පෙර නොදුටු විරු වටිනා අවස්ථාවක් බව නිසැකය.

*සටහන - ඇඹිලිපිටියේ*

♦ *විමලා යාපා* Cyprus


Strong. Safe. Reliable. MCG Mike Cooke Group

FASTCASH වෙතින් ගණුදෙනුකාර ඔබ සැමට විශේෂ වූ දීමනාවක්!

එන්න... අප සමඟ එකතු වී ඔබගේ මුදල් නොමිලේ ශ්‍රී ලංකාවට යවන්න.

ඔබගේ මිතුරාට අපගේ FASTCASH සේවය හඳුන්වා දීමෙන්, ඔබත් මිතුරාත් දෙදෙනාම මෙම විශේෂ දීමනාවට හිමිකරුවන් වන්න.



FAST CASH SEND TODAY - COLLECT TODAY

COMMERCIAL BANK, BOC, HNB, HSBC, සම්පත් බැංකුව SampathBank, PEOPLE'S BANK, Standard Chartered

* කොමර්ෂල්, හැටන් නැෂනල් සහ ලංකා බැංකු සමග එක්ව, දිවයින පුරා 500කට අධික ශාඛා ජාලයකින් එදිනම මුදල් ලබාගැනීමේ පහසුව
* ලංකාවේ ඕනෑම බැංකු ගිණුමකට මුදල් ක්ෂණිකව බැර කිරීම
* ඔබගේ NRFC / RFC විදේශ ගිණුම් වලට මුදල් බැර කිරීම
* රටවල් 120කට මුදල් යැවීමේ පහසුව
* ඔබගේ මුදල් මැද පෙරදිග අතරමැදියන් වෙත නොයා ක්ෂණිකව හා සෘජුවම ගිණුමට බැර කිරීමේ විශ්වාසය

Transfer Fees From only £5

020 8886 4488

Fastcash Financial Services Ltd
125-127 Bramley Road, Oakwood, London, N14 4UT
www.efastcash.biz

Trading Hours Open 7 days
Mon-Fri 9.00am-6.00pm
Sat - 9.30am-5.30pm
Sun- 10.00am-4.00pm